# කොළඹ දිසා අධිකරණයේ දී ය.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්. ආර්.

– එරෙහිව –

කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විසුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුළ පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

විත්තිකරු

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 109(1) වන වගන්තිය අනුව පැමිණිලිකරුගේ පෙත්සම, දිවුරුම්පත සහ "සී" ලකුණු කළ ලියවිල්ල මේ සමග ඉදිරිපත් කර සිටිනු ලබන අතර, එහි ඉල්ලා ඇති සහනයන් කාරුණිකව ප්‍රදානය කරන මෙන් ගෞරව පූර්වකව ඉල්ලා සිටිමි.

මෙම ඉල්ලීම පැමිණිලිකරුගේ නීතිඥවරයාට තහවුරු කර සිටීමට හැකි වන සේ මෙම කාරණය 1998 මැයි මස 14 වන දින විවෘත අධිකරණයේ සඳහන් කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

1998ක් වූ මැයි මස 7 වන දින කොළඹ දී ය.

Desilva

පැමිණිලිකරුගේ නීතිඥ

## කොළඹ දිසා අධිකරණයේ දී ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වූ කාරණයක් සම්බන්ධයෙනි.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්. ආර්.

– එරෙහිව –

කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විශුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුළ පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

විත්තිකරු

ස්වකීය නීතිඥ, ද සිල්වා සහ පෙරේරා නාමය සහ විලාශය යටතේ නීති වෘත්තියේ යෙදී සිටින ජේ. ඩබ්ලිව්. ඩී පෙරේරා මගින් පෙනී සිටිනු ලබන පැමිණිලිකරුගේ පෙත්සමෙහි පහත සඳහන් අයුරු ප්‍රකාශ කෙරේ.

1. පැමිණිලිකරු විසින් ("සී" යනුවෙන් ලකුණු කොට පිටපතක් මෙයට යාකරනු ලැබ ඇති) මෝසම මගින් හේතු ගත තත්වයන් විදහා දක්වමින්, මෙම නඩුවේ ප්‍රශ්නයට තුඩු දී ඇති සියළුම කාරණයන්ට අදාල, විත්තිකරුගේ සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන්නාවූ සියලුම ලේඛණ දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රකාශයට පත් කරන ලෙසට ඔහුට නියම කරමින් නියෝගයක් කරන ලෙසට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වන වගන්තිය යටතේ ඉල්ලීමක් අධිකරණය වෙත කරන ලද අතර, එම ඉල්ලීමට 98.03.09 දින අධිකරණය විසින් ඉඩ දෙමින්, විත්තිකරු වෙත ඔහුගේ ලේඛණගත නීතිඥවරුන් මාර්ගයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වන වගන්තිය යටතේ නොතිසයක් 98.03.10 වන දින නිකුත් කරන ලදී.

2. විත්තිකරු විසින් අධිකරණයේ ඉහත කී නියෝගය ඉටු කිරීමට අසමත් වෙමින්, පැමිණිලිකරු විසින් 98.04.27 දින තැපැලෙන් ලද 98.03.17 දින දරණ විරෝධතා ප්‍රකාශයක්, විත්තිකරුගේ දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කරමින් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, එහි විත්තිකරු විසින්, වෙනත් දේ අතර, මෙසේ සහතික කරනු ලැබ ඇත.

   1, මෙම නඩුවේ ප්‍රශ්නයට තුඩු දී ඇති කිසිදු කාරණයකට සම්බන්ධ වන්නාවූ, ලේඛණ කිසිවක් ඔහුගේ සන්තකයේ සහ හෝ බලය යටතේ නොමැති බවත්

   11. නොතිසියේ සඳහන් වන්නාවූ ලේඛණ පෞද්ගලික තත්වයෙන් ඔහුගේ සන්තකයෙහි නොමැති බවත් සහ/හෝ කෙසේ වෙතත් ඒවා වරප්‍රසාද ලත් ඒවා බවත්

3. පැමිණිලිකරු කියා සිටිනුයේ:

   1. පැමිණිල්ලෙහි වැඩිමනත්ව සඳහන් කරනු ලැබ ඇති පරිදි, විත්තිකරුට ඒ ගැන මත ප්‍රකාශ සහ හෝ ප්‍රකාශයක් කරමින් මැදිහත් වී හිල්ටන් සමථය අත්හිටුවීම සිදු කිරීමට නම්, මෙම නඩුවේ ප්‍රශ්නයට තුඩු දී ඇති සියලුම කාරණයන් හා ප්‍රධාන වශයෙන් සහ/හෝ සමූලික සම්බන්ධයෙන් වන ලේඛණ ඔහුගේ සන්තකයේහි හා බලය යටතේ තිබිය යුතු වන්නේය

   11. අදුල ලේඛණ ඔහුගේ සන්තකයෙහි හෝ බලය යටතේ නොමැතිව සහ ඒවා කියවා බැලීමකින් තොරව, ඉහත කී පරිදි මැදිහත් වීමට සහ මත ප්‍රකාශ සහ/හෝ ප්‍රකාශයන් කිරීමට විත්තිකරුට කළ නොහැකි බවත්ය.

   111. විත්තිකරු විසින් මෙම නඩුවේ ඉදිරිපත් කර ඇති උත්තරයේ 39 වන ඡේදයෙහි මෙසේ සම්ප්‍රකාශ කර ඇත.

   " කෙසේ වුවද එමෙන්ම, ඉහත කී කරුණු වලට හානියක් නොමැතිවද විත්තිකරු කියා සිටින්නේ සියළු හා වැදගත් කාල වලදී ඔහු නියෝජ්‍ය මුදල් ඇමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ බවත්ය "

iv. එම නිසා, මෙම නඩුවේ ප්‍රශ්නයට තුඩුදී ඇති සියළුම කාරණයන්ට අදාළ ලෙඛණ ඔහුගේ සන්තකයේ සහ බලය යටතේ තිබිය යුතු වූනි සහ/හෝ තිබිය යුතුය

v. උත්තර දීමට නියම කරමින් අධිකරණය විසින් කරනු ලැබ ඇත්තාවූ නියෝගයකට විරෝධතා ප්‍රකාශයක් ඉදිරිපත් කර සිටීමට සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානයන් යටතේ විත්තිකරුට හිමිකමක් නොමැත, මෙම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 109(2) වගන්තිය යටතේ අධිකරණය අවඥාවට ලක් කිරීමකි.

4. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වගන්තිය යටතේ කර ඇත්තා වූ නියෝගය ඉටු කිරීමට විත්තිකරු හිතාමතාම පැහැර හැර සහ හෝ උවමනාවෙන්ම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අතර එමගින් ඔහුගේ විත්තිවාචක (උත්තරය) කපා දැමීම සිදු කිරීමට සහ ඔහු පෙනී නොසිටි සහ උත්තර නො සැපයූ තත්වයටම තබනු ලැබීමට ඔහු යටත්ව සිටී. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 109(2) වගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමට වන ඔහුගේ අයිතිය පැමිණිලිකරු විසින් ඔහු සතුව රඳවා ගනු ලැබේ.

එබැවින් පැමිණිලිකරු ගෞරව පූර්වකව අයැද සිටිනු ලබන්නේ ගරු ඔබ තුමාගේ අධිකරණය: කාරුණිකව:

(අ) විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශය ප්‍රතික්ෂෙප කරන ලෙසත්,

(ආ) විත්තිකරුගේ උත්තරය කපා හරිමින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 109(1) වගන්තිය යටතේ නියෝගයක් කරන ලෙසත්,

(ඇ) විත්තිකරු පෙනී නොසිටි සහ උත්තර නො සැපයූ සේ සලකා නඩු විභාගය පවත්වා ගෙන යන ලෙසත්,

(ඇ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙය, සහ,

(ඉ) ගරු කටයුතු ඔබතුමාගේ අධිකරණයට මැනැවැයි පෙනී යන එවැනි වෙනත් සහ වැඩිදුර සහනයන් ප්‍රදානය කරන ලෙසත්ය.

පැමිණිලිකරුගේ නීතිඥ

"ඩී"

## කොළඹ දිසා අධිකරණයේ දී ය.

කොළඹ 10. ශ්‍රී විජුලසේන මාවතේ
අංක 167/4 දරන ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්. ආර්.

– එරෙහිව –

කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විශ්‍රමපාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුල පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

විත්තිකරු

විත්තිකරු, වෙනත් දේ අතර, නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් සිය රාජකාරි කටයුතු කරගෙන යන විට, ඔහු විසින් යෙදුනාවූ කටයුතු වලින් සහ/හෝ කරන ලද ක්‍රියාවන්ගෙන් පැමිණිල්ලේ සඳහන් කර ඇති නඩු නිමිත්ත පැන නැග ඇති අතර, එකී කටයුතු සහ/හෝ ක්‍රියාවන් වාර්තාගත කර සහ/හෝ ලේඛණගත කර, නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් විත්තිකරුගේ අධීක්ෂණය සහ/හෝ පාලනය සහ/හෝ බලය යටතේ මුදල් අමාත්‍යාංශය/මහ භාණ්ඩාගාරය විසින් පවත්වා කරන සහ තබා ගෙන ඇති සමහර ලිපිගොනු වල ගොනු කර ඇති අතර, ඒ අනුව එකී ලිපි ගොනු විත්තිකරුගේ සන්තකයේ හෝ බලය යටතේ තිබෙන හෙයින්

එකී ලිපි ගොනුවල ඇති ලියකියවිලි මෙම නඩුවට සම්බන්ධ ප්‍රස්තුත කාරණා වලට කෙලින්ම සම්බන්ධතාවයක් ඇති අතර, මෙම නඩුවේ විවාදයට භාජනය වන කාරණා පිළිබඳව එලදායී ලෙස යුදුය්සක් කිරීමට ඉතාමත් අවශ්‍ය වන හෙයින් ද

ඉහත කරුණු තිබෙන හැටියට, මෙම නඩුවේ ප්‍රස්තුත සියලු කාරණයන්ට අදාලව, විත්තිකරු සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන සියලු ලියකියවිලි දිව්රුම් ප්‍රකාශයකින් ප්‍රකාශයට පත් කරන ලෙස විත්තිකරුට නියම කරමින් ගරු අධිකරණය කාරුණිකව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 (1) වගන්තිය යටතේ නියෝගයක් කරන ලෙසට අපි අයද සිටිමු

ගරු අධිකරණය කාරුණිකව, එම නියෝගය පිළිබඳ නොතිසිය ("බී" ලකුණු කර අමුණා ඇති ආකෘතිය අනුව) විත්තිකරුගේ ලේඛනගත නීතිඥවරුන් මගින් ඔහු වෙත භාර දීමට නියම කරන ලෙසත් අපි අයද සිටිමු

පැමිණිලිකරුගේ නීතිඥ මහතාට මෙම මෝසම සනාථ කිරීමට හැකිවනසේ ගරු අධිකරණය කාරුණිකව 1998 මාර්තු මස 06 වැනි දින මෙම නඩුව කැඳවන ලෙස අපි තවදුරටත් අයද සිටිමු

TRUE COPY

DE SILVA & PERERA
Attorneys-at-law & Notaries Public
Nos. 34/64,65 & 1/19, New Law ... Complex,
SAN SEBASTIAN HILL
COLOMBO - 12.

1998 මාර්තු මස 05 වැනි දින

පැමිණිලිකරුගේ නීතිඥවරුන්